ජර්මන් ෆෙඩරල් ජනරජය

සංක්‍රමණ හා
සරණාගතයන්
පිළිබඳ ෆෙඩරල්
කාර්යාලය

euaa
EUROPEAN UNION
AGENCY FOR ASYLUM

# ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා නැවත අයදුම් කිරීමේ දී ඔබ දැනගත යුතු දේ (පසුකාලීන අයදුම්පත)



SINHALESE

**ඔබ දැන් ජර්මනියේ සිටින අතර, එය** EU+ **රටකි.**
EU+ **රටවල් වන්නේ**:

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

# පටුන


පසුකාලීන අයදුම්පතක් යනු කුමක්ද? 3

ක්‍රියාපටිපාටිය කුමක්ද? 5

- ➢ 1 වන පියවර: ඔබේ අයදුම්පත ලියාපදිංචි කර නැවත ඉදිරිපත් කළ යුතුය 5
- ➢ 2 වන පියවර : ඔබේ අයදුම්පත පූර්ව පරීක්ෂා කිරීම 9
- ➢ 3 වන පියවර : ඔබේ අයදුම්පත යෝග්‍යතාවය මත පරීක්ෂා කිරීම 11
- ➢ 4 වන පියවර : ඔබේ අයදුම්පත පිළිබඳ තීරණය 12

මගේ අයිතීන් මොනවාද? 13

මගේ වගකීම් මොනවාද? 17

මම මගේ වගකීම් ඉටු නොකරන්නේ නම් එහි ප්‍රතිවිපාක මොනවාද? 21

ඔබට අවශ්‍ය නම් විශේෂ සහාය ලැබෙනු ඇත 23

ඔබට ඔබේ රටට ආපසු යාමට අවශ්‍ය නම් කුමක් කළ යුතුද? 24

## පසුකාලීන අයදුම්පතක් යනු කුමක්ද?

**ඔබ ඕනෑම EU+ රටක දෙවන වරට හෝ ඊට වැඩි වාරයක් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කරන විට, ඔබේ නව අයදුම්පත හඳුන්වන්නේ පසුකාලීන අයදුම්පතක් ලෙස ය.**

ඔබේ පෙර අයදුම්පත වෙනත් EU+ රටක සකස් කර තිබුණ ද, ඔබේ නව අයදුම්පත පසුකාලීන අයදුම්පතකි.

පසුකාලීන අයදුම්පතක් යනු ඔබට ලැබුණු පෙර තීරණයට අභියාචනයක් නොවේ. ඔබේ පෙර අයදුම්පත සම්බන්ධ ක්‍රියාපිළිවෙත අවසන් වූ පසු පමණක් ඔබට පසුකාලීන අයදුම්පතක් සකස් කළ හැකිය. මෙයින් අදහස් වන්නේ:

- ඔබේ පෙර අයදුම්පත සම්බන්ධව ඔබට දැනටමත් තීරණයක් ලැබී ඇති බව
- දැනට පවතින අභියාචනයක් නොමැති බව සහ
- අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඇති කාලසීමාව ඉකුත් වී ඇති බව ය.

සරලව ම පෙර තීරණයට එකඟ නොවීම නැවත ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කිරීමට හේතුවක් නොවේ.

ඔබ පසුකාලීන අයදුම්පතක් ඉදිරිපත් කරන්නේ නම්, ජාත්‍යන්තර ආරක්ෂාවක් අවශ්‍ය බවට ඔබේ ප්‍රකාශයට සහාය වන **නව අංග (සාක්ෂි හෝ ලේඛන වැනි)** ඔබ ඉදිරිපත් කළ යුතුය.



**නව අංග** යනු ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබේ හිමිකම් පෑමට සහාය වන සහ ඔබේ පෙර අයදුම්පත(පත්) අතරතුර ඔබට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අංග වේ.



නව අංග ඔබට ලැබුණු නව ලේඛන හෝ සාක්ෂි හෝ ඔබේ අවසන් අයදුම්පත පිළිබඳව වන තීරණයේ දිනයෙන් පසුව සිදු වූ සිදුවීම් විය හැකිය, උදාහරණයක් ලෙස:

- ඔබට සිදු වූ නව සිදුවීම්
- ඔබේ මව් රටේ සිදු වූ නව සිදුවීම්
- ඔබේ පුද්ගලික තත්ත්වයේ සිදු වූ වෙනස්කම්.

**සුවිශේෂී ලෙස**, **පහත සඳහන් හේතුවලින් එකක් අදාළ වන්නේ නම්**, **නව අංග ඔබේ පෙර අයදුම්පත අතරතුර පැවති අංග ද විය හැකිය**.

- ඔබ පෙර අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ දී මෙම නව අංග පිළිබඳව ඔබට දැන ගැනීමට නොහැකි වීම.
- යහපත් හේතුවක් නිසා, ඔබට මෙම නව අංග පිළිබඳව කතා කළ නොහැකි වීම. මෙම අවස්ථාවේ දී, ඔබ මෙම හේතු පැහැදිලි කිරීමට අවශ්‍ය වනු ඇත.

ඔබේ පෙර අයදුම්පතෙහි ඉදිරිපත් කළ තොරතුරු සලකා බලනු ඇත. කෙසේ වෙතත්, ඔබේ පෙර අයදුම්පත නැවත පරීක්ෂා නොකරනු ඇත.

# ක්‍රියාපටිපාටිය කුමක්ද?

ඔබ නැවතත් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කරන බව බලධාරීන්ට දැනුම් දීමෙන් පසුව (එය පසුකාලීන අයදුම්පතක් ලෙස හැඳින්වේ), ක්‍රියාපටිපාටියෙහි පියවර කිහිපයක් තිබේ.

**1 වන පියවර. ඔබේ අයදුම්පත ලියාපදිංචි කර නැවත ඉදිරිපත් කළ යුතුය**

ලියාපදිංචි කිරීමට සහ ඉදිරිපත් කිරීමට පහත සඳහන් අංග ඇතුළත් වේ.



ඔබේ ඇඟිලි සලකුණු ලබා ගනු ඇත.



ඔබේ ඡායාරූපය ලබා ගනු ඇත.




ඔබේ සියලුම අනන්‍යතාවය, ගමන් සම්බන්ධ සහ වෙනත් අදාළ ලේඛන මෙන්ම ඔබ සතුව පවතින නව ලේඛන ඉදිරිපත් කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත.




ඔබේ සම්බන්ධතා තොරතුරු (ලිපිනය, දුරකථන අංකයක් සහ ඊමේල් ලිපිනයක්) ලබා දෙන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත.



ඔබට වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීමට සිදු විය හැකිය.



ඔබ සහ ඔබේ බඩු භාණ්ඩ සෝදිසි කළ හැකිය. ඔබේ පුද්ගලික බඩු භාණ්ඩ ඔබට අයත් දේ ලෙස පවතින අතර භයානක යැයි සැලකෙන ඕනෑම බඩු භාණ්ඩයක් හැර ඔබට ආපසු ලබා දෙනු ඇත.



ඔබෙන් පහත සඳහන් දේ ඉල්ලා සිටිනු ඇත,

- මෙම රටේ හෝ වෙනත් EU+ රටක පදිංචි ඔබේ පවුලේ සාමාජිකයන් (කිසිවෙකු සිටි නම්) පිළිබඳව ඔබේ පුද්ගලික විස්තර සහ තොරතුරු ලබා දීමට;
- පසුකාලීන අයදුම්පත සකස් කිරීමට හේතු පැහැදිලි කිරීමට.



පහත සඳහන් දේ කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත.



- ඔබේ අයදුම්පතට සහාය වීම සඳහා ඇති සියලුම තොරතුරු සහ ලේඛන ඉදිරිපත් කිරීමට. ඔබ පසුකාලීන අයදුම්පතක් සකස් කිරීමට පාදක කරගත් නව අංග මෙයට ඇතුළත් වේ. නව අංග ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව අවශ්‍ය බවට යෝජනා කරන නව කරුණු හෝ සාක්ෂි විය හැකිය.
- ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඔබේ පෙර අයදුම්පත් පිළිබඳව ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට.



ඔබ බලධාරීන් සමඟ බෙදා ගන්නා ඕනෑම තොරතුරක් රහසිගතව පවතිනු ඇත. මෙම තොරතුරු කිසි විටෙකත් ඔබ ආරක්ෂාව පතන අය සමඟ බෙදා නොගනු ඇත.

## ඔබේ අයදුම්පත ලියාපදිංචි කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු වන්නේ කවදා ද සහ කොහේදී ද?

ඔබගේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පත, ඔබට දැනුම් දෙන දිනයේ සහ වේලාවේදී, පිළිගැනීමේ මධ්‍යස්ථායකදී හෝ සංක්‍රමණ හා සරණාගතයන් පිළිබඳ ෆෙඩරල් කාර්යාලයේදී ලියාපදිංචි කරනු ලැබේ. අයදුම් කිරීමෙන් හෝ පරීක්ෂාව අවසන් වීමෙන් පසු උපරිම දින 5ක් ඇතුළත ලියාපදිංචිය සිදු කළ යුතුය.

ඔබගේ අයදුම්පත ලියාපදිංචි කළ පසු, ලියාපදිංචියේදී ඔබට දැනුම් දෙන දිනයේ සහ වේලාවේදී ඔබ එය පුද්ගලිකව ඉදිරිපත් කළ යුතුය. ඔබගේ අයදුම්පත ලියාපදිංචි කළ දිනයේ සිට උපරිම දින 21ක් ඇතුළත එය ඉදිරිත් කළ යුතුය.

විශේෂ අවස්ථාවලදී, සරණාගතභාවය සඳහා අයදුම් කිරීමට සහ අයදුම්පත ඉදිරිපත් කිරීමට ඇති අදහස, නියමිත පෝරමයක් භාවිතා කරමින් සංක්‍රමණ හා සරණාගතයන් පිළිබඳ ෆෙඩරල් කාර්යාලයට දැනුම් දිය යුතුය.

ඔබේ අයදුම්පත ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ. ඔබ අයදුම්පත ඉදිරිපත් නොකළහොත්, එසේ නොකිරීමට හේතුව ඔබගේ පාලනයෙන් පිටත වූවක් නොවන්නේ නම්, ඔබගේ අයදුම්පත ඉල්ලා අස් කරගත් එකක් ලෙස සලකනු ලැබේ. මෙයින් අදහස් වන්නේ ඔබට අයදුම්කරුවෙකු ලෙස ඇති තත්ත්වය, සහාය සහ සේවාවන් ලබා ගැනීමේ අයිතිය, සහ ජර්මනියේ රැඳී සිටීමේ අයිතිය අහිමි විය හැකි බවයි.





ලියාපදිංචියෙන් පසුව, ඔබේ අයදුම්පත සකස් කර ලියාපදිංචි කර ඇති බවට නිල ලේඛනයක් ඔබට ලැබෙනු ඇත.

ඔබ එය සැමවිටම ඔබ සමඟ රැගෙන යා යුතුය.

## 2 වන පියවර. ඔබේ අයදුම්පතෙහි මූලික පරීක්ෂා කිරීම



ඔබේ අයදුම්පත ඉදිරිපත් කළ පසු, මීළඟ පියවර වන්නේ **ඔබේ අයදුම්පතෙහි මූලික පරීක්ෂා කිරීමයි**.
**මූලික පරීක්ෂා කිරීම අතරතුර, ඔබ ඉදිරිපත් කළ අංග ඇත්ත වශයෙන් ම නව අංග ද යන්න සහ මෙම අංග මඟින් ඔබේ ප්‍රතික්ෂේප කරන ලද පෙර අයදුම්පතෙහි ප්‍රතිඵලය වෙනස් කිරීමට ඉඩ තිබේ ද යන්න බලධාරීන් විසින් තක්සේරු කරනු ඇත**.



මූලික පරීක්ෂා කිරීම අතරතුර, ඔබට සම්මුඛ පරීක්ෂණයකට ආරාදනා කළ හැකිය. ඔබට සම්මුඛ පරීක්ෂණයකට ආරාධනා නොලැබුණේ නම්, මූලික පරීක්ෂා කිරීම ගොනුවේ ඉදිරිපත් කර ඇති අංග මත පමණක් පදනම් වනු ඇත.

මූලික පරීක්ෂා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ඔබේ අයදුම්පත සලකා බැලිය හැකිය:

- **පිළිගත හැකිය**, නැතහොත්
- **පිළිගත නොහැකිය**.

ඔබේ අයදුම්පත **පිළිගත හැකි නම්**, **ඔබේ අයදුම්පත තවදුරටත් පරීක්ෂා කෙරෙනු ඇත**. මෙයින් අදහස් වන්නේ ඔබ සම්මත රැකවරණ ක්‍රියාපටිපාටියේ ඇති පියවර ම අනුගමනය කරනු ඇති බවයි.

ඔබේ අයදුම්පත **පිළිගත නොහැකි නම්**, **එය තවදුරටත් පරීක්ෂා නොකෙරෙනු ඇති අතර ක්‍රියාපටිපාටිය අවසන් වනු ඇත**. ඔබේ අයදුම්පත පිළිගත නොහැකි වීමට හේතු පිළිබඳව බලධාරීන් ඔබට දන්වනු ඇත. තීරණය පිළිබඳව ඔබට ලිඛිතව දැනුම් දෙනු ඇත. ඔබ තීරණයට එකඟ නොවන්නේ නම්, ඔබට එයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. ඔබට අභියාචනය කිරීමට සහාය වීම සඳහා නීති උපදේශකයෙකු (නීතිඥයෙකු) නොමිලේ ඉල්ලා සිටිය හැකිය.




ඔබේ අයදුම්පතෙහි **නව අංග** ඉදිරිපත් කරන්නේ නම් සහ මෙම නව **අංග මඟින් ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව අවශ්‍ය බව යෝජනා කරන්නේ නම්**, ඔබේ අයදුම්පත **පිළිගත හැකිය**.

ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව අවශ්‍ය බව යෝජනා කරන නව අංග ඔබ ඉදිරිපත් නොකරන්නේ නම්, ඔබේ අයදුම්පත **පිළිගත නොහැකිය**.

**ඔබේ අයදුම්පත පිළිගත හැකි බව පෙනී ගියහොත්, පහත පියවර අදාළ වනු ඇත.**

## 3 වන පියවර. ඔබේ අයදුම්පත යෝග්‍යතාවය මත පරීක්ෂා කිරීම

ඔබේ අයදුම්පත පිළිගත හැකි නම්, ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටීමට හේතු සහ ඔබ ඔබේ මව් රටට ආපසු යාමට අකමැති වීමට හේතුව බලධාරීන් විසින් පරීක්ෂා කරනු ඇත (එය යෝග්‍යතාවය මත පරීක්ෂා කිරීමක් ලෙස හැඳින්වේ). ඔබේ අයදුම්පත පිළිගත හැකි නම්, එය සම්මත ඊකවරණ ක්‍රියාටිපාටියේ ඇති පියවර ම අනුගමනය කරනු ඇත. කෙසේ වෙතත්, ඔබේ පසුකාලීන අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වන කාලය වේගවත් විය හැකිය.



ඔබේ ගොනුවේ ඇති අංග මත පදනම්ව අධිකාරියට සෘජුවම අමුමත තීරණයක් ගත නොහැකි නම්, ඔබට පුද්ගලික සම්මුඛ පරීක්ෂණයකට ආරාධනා කරනු ඇත.

**වෛද්‍ය පරීක්ෂණය**



අතීත වධ හිංසා හෝ බරපතල හානි පිළිබඳ ලක්ෂණ සැලකිල්ලට ගනිමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වන ලෙස බලධාරීන් ඔබෙන් ඉල්ලා සිටිය හැකිය. පරීක්ෂණය සිදුවන්නේ ගාස්තු අය කිරීමකින් තොරව වන අතර ඒ සඳහා ඔබේ කැමැත්ත ලබා දෙන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත.

පරීක්ෂණයේ ප්‍රතිඵල පිළිබඳව ඔබට දැනුම් දෙනු ලබන අතර, එය ඔබේ අයදුම්පත තක්සේරු කිරීමේ දී සැලකිල්ලට ගනු ඇත. බලධාරීන් විසින් කිසිදු පරීක්ෂණයක් ඉල්ලා නොමැති නම්, ඔබට ඔබේම වියදමින් පරීක්ෂණය ඉල්ලා සිටිය හැකිය.

# 4 වන පියවර. ඔබේ අයදුම්පත පිළිබඳ තීරණය



ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව ලබා දී තිබේද නැද්ද යන්න පිළිබඳව බලධාරීන් ඔබට ලිඛිතව දැනුම් දෙනු ඇත.



## අභියාචනා කිරීමට ඇති හැකියාව

ඔබ තීරණයට එකඟ නොවන්නේ නම්, ඔබට එය අභියාචනය කළ හැකිය.

# ඔබේ අයිතීන් මොනවාද?

## ඔබට නැවතී සිටීමට සහ පිළිගැනීමේ සහාය සහ සේවාවන් ලබා ගැනීමට ඇති අයිතිය

එය ඔබේ පළමු පසුකාලීන අයදුම්පත නම්, ප්‍රතිපත්තිමය වශයෙන් ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම අවසන් වන තෙක් ඔබට මෙම රටේ රැඳී සිටීමට අවසර ඇත.

**ඔබේ අයදුම්පත පරීක්ෂා කරන අතරතුර ඔබට රැඳී සිටීමට අවසර නොලැබිය හැකිය**, එසේ නම්:

- එය ඔබේ දෙවන හෝ ඊට වැඩි වූ අයදුම්පත වේ; හෝ
- ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කළේ ඔබව මෙම රටෙන් ඉක්මනින් ඉවත් කිරීම ප්‍රමාද කිරීමට පමණි.

**අභියාචනා ක්‍රියාපටිපාටිය අතරතුර ඔබට රැඳී සිටීමට අවසර නොලැබිය හැකිය**. මෙම අවස්ථාවේ දී, බලධාරීන් විසින් ඔබට එයට හේතු සහ අභියාචනා ක්‍රියාපටිපාටිය අතරතුර රැඳී සිටීමට අවසර ඉල්ලා සිටිය හැකිද යන්න සහ ඒ කෙසේද යන්න පිළිබඳව ඔබට දැනුම් දෙනු ඇත.

ඔබ රැඳී සිටින කාලය තුළ, ඔබට **පිළිගැනීමේ සහාය සහ සේවාවන්** ලැබෙනු ඇත; කෙසේ වෙතත්, අදාළ අධිකාරියේ තනි තීරණයක් මත පදනම් ව මේවා **සීමිත විය හැකිය**. ඔබට ලැබෙන පිළිගැනීමේ සහාය සහ සේවාවන් පිළිබඳ වැඩිදුර තොරතුරු වෙනම විස්තර පත්‍රිකාවකින් සොයාගත හැකිය.





## ඔබට භාෂා පරිවර්තනය ලබා ගැනීමට අයිතිය ඇත



ඔබ ජර්මානු භාෂාව කතා නොකරන්නේ නම්, ලියාපදිංචි කිරීමේ දී සහ අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී මෙන්ම ඔබේ පුද්ගලික සම්මුඛ පරීක්ෂණයේ දී, එවැන්නක් සිදු වුවහොත් බලධාරීන් සමඟ සන්නිවේදනය කිරීමට භාෂා පරිවර්තකයෙකු ඔබට සහාය වනු ඇත. භාෂා පරිවර්තකයාට ගාස්තු අය කිරීමක් නොමැත.

## ඔබට සම්පූර්ණයෙන් ම ඔබේ අදහස් ප්‍රකාශ කිරීමට උපකාරී වේ නම්, ඔබේ පුද්ගලික සම්මුඛ සාකච්ඡාව සඳහා පිරිමි හෝ ගැහැණු භාෂා පරිවර්තකයෙකු සහ සම්මුඛ පරීක්ෂකයෙකු ඉල්ලා සිටිය හැකිය



ඔබේ හේතු මත සහ ලැබිය හැකි බවක් තිබේ නම්, ඔබේ ඉල්ලීම ඉටු කෙරෙනු ඇත.

## ඔබට තොරතුරු ලබා ගැනීමට සහ නොමිලේ නීති උපදේශනය ඉල්ලා සිටීමට අයිතිය ඇත

රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර, ඔබට නොමිලේ නීති උපදේශනය ඉල්ලා සිටිය හැකිය.



කෙසේ වෙතත්, **ඔබට පහත හේතු මත නොමිලේ නීති උපදේශනය සඳහා හිමිකම් නොලැබිය හැකිය**:

- ඔබ ඔබේ පසුකාලීන අයදුම්පත ඉදිරිපත් කරන ලද්දේ ආපසු යාමේ ක්‍රියාපටිපාටිය 'නවත්වා ගැනීමට' පමණක් නම්, හෝ
- මෙය ඔබේ දෙවන (හෝ ඊට වැඩි) පසුකාලීන අයදුම්පත නම්.

සංක්‍රමණ හා සරණාගතයන් පිළිබඳ ෆෙඩරල් කාර්යාලයෙන් ඔබට තොරතුරු සහ නීති උපදේශනය ඉල්ලා සිටිය හැකිය.

## ඔබට නීති උපදේශකයෙකුගෙන් (නීතිඥවරයෙකුගෙන්) උපදෙස් ලබාගත හැකිය ඔබේ ම වියදමින්

නීති උපදේශකයෙකු යනු බලධාරීන් සමඟ කටයුතු කිරීමේ දී ඔබට පුද්ගලික නීතිමය සහාය හෝ නියෝජනය ලබා දෙන පුද්ගලයෙකි. රැකවරණ ක්‍රියාපටිපාටියේ ඕනෑම අදියරක දී ඔබේ ම වියදමින් නීති උපදේශකයෙකුගෙන් උපදෙස් ලබා ගැනීම ඔබේ අයිතියකි.



නීතිමය නියෝජනය සඳහා වන වියදම් දැරීමට අවශ්‍ය සම්පත් ඔබට නොමැති නම්, නීතිමය පිළියම් ක්‍රියාපටිපාටිය අතරතුර ඔබට නොමිලේ නීති සහාය ඉල්ලා සිටිය හැකිය.

ඔබ යම් නීති උපදේශකයෙකුට වඩාත් කැමති නම්, හැකි ඉක්මනින් ඔවුන්ගේ සම්බන්ධතා තොරතුරු බලධාරීන් සමඟ බෙදා ගන්න.

ඔබේ නීති උපදේශකයාගේ තොරතුරු බලධාරීන් සමඟ බෙදා ගන්න, එවිට ඔවුන්ට ඔබේ අයදුම්පත පිළිබඳව ඔවුන්ව දැනුවත් කළ හැකිය.

## ඔබට එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) හෝ වෙනත් සංවිධාන සමඟ අදහස් හුවමාරු කරගත හැකිය

රැකවරණ ක්‍රියාපටිපාටියේ ඕනෑම පියවරක දී ඔබට UNHCR හෝ ඔවුන්ගේ හවුල්කාර සංවිධාන සමඟ සම්බන්ධ වී අදහස් හුවමාරු කරගත හැකිය.




UNHCR රැකවරණය සොයන්නන්ගේ සහ සරණාගතයින්ගේ අවශ්‍යතා සහ අයිතීන් ආරක්ෂා කරයි. UNHCR හෝ ඔවුන්ගේ හවුල්කාර සංවිධාන ද රැකවරණය සොයන්නන් සඳහා තොරතුරු සහ සහාය ලබා දෙයි.

UNHCR හි සම්බන්ධතා තොරතුරු මෙන්ම රැකවරණ ක්‍රියාපටිපාටිය පිළිබඳ තොරතුරු UNHCR වෙබ් පිටුව වන https://help.unhcr.org/ වෙතින් සොයාගත හැකිය.

අයදුම්කරුවන්ට නීති උපදෙස් හෝ වෙනත් උපදේශන සපයන වෙනත් ඕනෑම සංවිධානයක් හා සම්බන්ධ විය හැකිය.

## ඔබේ වගකීම් මොනවාද?

### මෙම රටේ නීති අනුගමනය කරන්න



### ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කළ රටේම රැඳී සිටින්න




වෙනත් EU+ රටකට යාමට උත්සාහ නොකරන්න. ඔබට වෙනත් EU+ රටකට ගමන් කිරීමට අවසර ලැබෙන්නේ බලධාරීන් විසින් එසේ කිරීමට අවසර ලබා දෙන්නේ නම් පමණි.

### බලධාරීන්ට ඔබ වෙත ළඟා විය හැකි බවත් ඔබේ යොදාගන්නා ලද හමුවීම් ඔබ තබා ගන්නා බවත් සහතික කර ගන්න




බලධාරීන් විසින් ඔබෙන් ඉල්ලා සිටින සෑම අවස්ථාවකදී ම ඔබ පුද්ගලිකව සියලුම යොදාගන්නා ලද හමුවීම් සඳහා සහභාගී විය යුතුය. ඔබ නියමිත වේලාවට එහි සිටිය යුතුය. බරපතල හේතුවක් නිසා ඔබට යොදාගන්නා ලද හමුවීමකට සහභාගී වීමට නොහැකි නම්, වහාම බලධාරීන්ට දන්වා හේතුව පැහැදිලි කරන්න.



# බලධාරීන් සමඟ පූර්ණ සහයෝගයෙන් කටයුතු කරන්න

ඉල්ලා සිටින විට, ඔබ පහත සඳහන් දේ කළ යුතුය.

- ඔබේ අයදුම්පතට සහාය වීම සඳහා ඔබේ පුද්ගලික තොරතුරු, ලේඛන සහ අනෙකුත් අදාළ තොරතුරු ලබා දෙන්න.




- හැඳුනුම් ලේඛන ලබා දෙන්න. ඔබ සතුව ඒවා නොමැති නම්, එයට හේතුව පැහැදිලි කරන්න.





- ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබා ගැනීමට ඉඩ දෙන්න.





- ඔබේ අයදුම්පත නියමිත දිනයක සහ ස්ථානයක දී ඉදිරිපත් කරන්න.
- පුද්ගලික සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී සම්මුඛ පරීක්ෂණය අතරතුර ප්‍රශ්නලලට පිළිතුරු ලබා දෙන්න.



- බලධාරීන් ඔබගෙන් එසේ ඉල්ලා සිටින්නේ නම්, ඔබව පරීක්ෂා කිරීමට සහ ඔබේ පුද්ගලික භාණ්ඩ පරීක්ෂා කිරීමට එකඟ වන්න. පරීක්ෂාවක් සිදු කරනු ලබන්නේ අවශ්‍ය සහ සාධාරණ හේතු ඇති අවස්ථාවලදී පමණි. පරීක්ෂාව සිදු කිරීමට හේතු බලධාරීන් ඔබට පැහැදී කරනු ඇත. පරීක්ෂාව ඔබ හා සමාන ලිංගයේ පුද්ගලයෙකු විසින්, ඔබේ ගෞරවයට ගරු කරන ආකාරයෙන් සිදු කරනු ලැබේ.

## සත්‍යය පවසන්න



ඔබේ අයදුම්පතෙහි විශ්වසනීයත්වය සඳහා ඔබ පවසන දේ ඉතා වැදගත් වේ. මේ නිසා ඔබ අවංක විය යුතු අතර ඔබේ අනන්‍යතාවය, පවුල, උපන් රට, ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටීමට හේතු පිළිබඳ සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු ලබා දිය යුතුය.

ඔබට සියල්ල මතකයේ තබාගත නොහැකි විය හැකි නිසා ඔබට සියලුම ප්‍රශ්නලලට පිළිතුරු ලබා දීමට නොහැකි විය හැකිය. මෙම අවස්ථාවේ දී, ඔබේ මතකයේ නොමැති පිළිතුරු ගොතා පැවසීම සිදු නොකරන්න.

## නිවැරදි සම්බන්ධතා තොරතුරු ලබා දී සම්බන්ධ කරගත හැකිව සිටින්න




ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබේ අයදුම්පත සම්බන්ධව බලධාරීන්ට ඔබ හා සම්බන්ධ වීමට හැකි විය යුතුය.

ඔබේ ලිපිනය, ඊමේලය හෝ දුරකථන අංකය වෙනස් වුවහොත්, වහාම බලධාරීන්ට දන්වන්න.

**මතක තබා ගන්න, ඔබේ අයදුම්පත පරීක්ෂා කරන අතරතුර ඔබ ජර්මනියෙන් පිටව නොයා යුතුය.**

ඔබව මධ්‍යස්ථායයක නවාතැන් ගැනීමට සලස්වන්නේ නම්, බලධාරීන්ගේ අවසරයකින් තොරව වෙනත් ස්ථානයකට යාම නොකළ යුතුය.

## ඔබේ අයදුම්පතට සහාය දක්වන සියලුම තොරතුරු සහ ලේඛන, ඔබට අදාළ සංක්‍රමණ හා සරණාගතයන් පිළිබඳ ෆෙඩරල් කාර්යාලයේ ශාඛා කාර්යාලයට ඉදිරිපත් කරන්න.

ඔබට පුද්ගලික සම්මුඛ පරීක්ෂණයක් සඳහා ආරාධනා නොලැබීමේ හැකියාවක් පවතින අතර, ක්‍රියාපටිපාටිය ඉතා කෙටි කාලයක් පවතිනු ඇති අතර එයට දින කිහිපයක් හෝ පැය කිහිපයක් පමණක් ගතවනු ඇත. එනිසා, ඔබ නැවත අයදුම් කිරීමට හේතු සහ නව අංග සියල්ල ම බලධාරීන්ට ප්‍රමායකක් තොරව පැවසීම වැදගත් වේ.

හැකි සෑමවිටම ඔබට මුල් ලේඛන ඉදිරිපත් කිරීමට සිදුවේ. ඔබ ව්‍යාජ ලේඛනයක් ඉදිරිපත් නොකළ යුතුය.




ඔබේ අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී, සියලුම තොරතුරු සහ ලේඛන හැකි ඉක්මනින් ඉදිරිපත් කළ යුතුය. ඔබට ලේඛන වහාම ලබා ගත නොහැකි නම්, තීරණයක් ගන්නා තෙක් ඒවා හැකි ඉක්මනින් ඉදිරිපත් කළ යුතුය. ඔබේ ගොනු අංකය සඳහන් කරමින්, ලේඛන තැපෑලෙන් හෝ ඔබට අදාළ ශාඛා කාර්යාලයට පුද්ගලිකව හෝ service@bamf.bund.de වෙත ඊමේල් මඟින් ඉදිරිපත් කළ හැකිය.

# ඔබ ඔබේ වගකීම් ඉටු නොකරන්නේ නම් එහි ප්‍රතිවිපාක මොනවාද?

## ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නවත්වනු ඇත




ඔබේ අයදුම්පත **ඉල්ලා අස්කර ගත් හෝ ප්‍රතික්ෂේප කළ** බවට සලකනු ඇත.

මෙයින් අදහස් වන්නේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු ලෙස ඔබේ තත්ත්වය සහ ඒ ආශ්‍රිත සියලුම අයිතීන් ඔබට අහිමි විය හැකි බවයි.

ඔබ පහත සඳහන් දේ ඉටු කිරීම ප්‍රතික්ෂේප කළහොත් මෙය සිදුවනු ඇත :

- තොරතුරු ඉල්ලා සිටින විට ඒවා ලබා දීමට
- ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබා ගැනීමට ඉඩ දීමට
- ඔබේ ලිපිනය ලබා දීමට
- ඔබේ පුද්ගලික සම්මුඛ පරීක්ෂණය අතරතුර, එවැන්නක් තිබේ නම් ප්‍රශ්නවලට පිළිතුරු දීමට

ඔබ පහත සඳහන් දේ කිරීමෙන් ද මෙය සිදුවනු ඇත:

- බරපතල හේතුවක් නොමැතිව නියමිත කාල සීමාව තුළ ඔබේ අයදුම්පත ඉදිරිපත් නොකිරීම
- බරපතල හේතුවක් නොමැතිව පුද්ගලික සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවීම
- බලධාරීන් වෙත වාර්තා කිරීමට ඉල්ලා සිටින විට දී එසේ නොකිරීම
- ඔබ නැවතී සිටීමට බැඳී සිටින ස්ථානයේ රැඳී නොසිටීම
- බලධාරීන්ට සම්බන්ධ කරගත නොහැකි වීම
- රට හැර යාම.

රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර ඕනෑම අවස්ථාවක ඔබේ අයදුම්පත ඉල්ලා අස්කර ගැනීමට ද ඔබට තීරණය කළ හැකිය, උදාහරණයක් ලෙස, ඔබ ඔබේ රටට ආපසු යාමට තීරණය කළ නිසා. මෙම අවස්ථාවේ දී, ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු ලෙස ඔබේ තත්ත්වය ඔබට අහිමි වනු ඇත.

## ඇතැම් ආකාරයේ පිළිගැනීම් සහාය සහ සේවාවන් අවම කිරීම හෝ අවලංගු කිරීම සිදු කළ හැකිය



ඇතැම් තත්ත්වයන් යටතේ, සහාය සේවා සම්බන්ධ බලධාරීන්ට ඇතැම් ආකාරයේ සහාය හෝ ඇතැම් සේවාවන් අඩු කිරීමට හෝ අවලංගු කිරීමට තීරණය කළ හැකිය. ඔබේ තත්ත්වය ඇගයීමෙන් පසු, එවැනි තීරණයක් පිළිබඳව සහාය සේවා සම්බන්ධ බලධාරීන් ඔබට ලිඛිතව දැනුම් දෙනු ඇත.

## ඔබේ අයදුම්පතට සෘණාත්මක බලපෑමක් ඇති විය හැකිය

ඔබේ අනන්‍යතාවයට හෝ ඔබේ අයදුම්පතට අදාළව නොමඟ යවන හෝ අසත්‍ය තොරතුරු ඔබ ලබා දෙන්නේ නම්, හෝ ඔබ ලේඛන විනාශ කරන්නේ නම් හෝ ව්‍යාජ ලෙස සකස් කරන්නේ නම්, එය ඔබේ අයදුම්පතට සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකිය, උදාහරණයක් ලෙස එය පහත පරිදි වේ.



- ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකි අතර ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව නොලැබෙනු ඇත.
- ඔබේ අයදුම්පත රැකවරණ දේශ සීමා ක්‍රියාපටිපාටිය තුළ පරීක්ෂාවට ලක් විය හැකිය. (මෙය සිදුවුවහොත්, ක්‍රියාපටිපාටිය පිළිබඳව ඔබට නිශ්චිත තොරතුරු ලැබෙනු ඇත).

රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර ඔබ සත්‍යය නොකියූ බව බලධාරීන් පසුව දැනගතහොත් ජාත්‍යන්තර ආරක්ෂාව ද ඔබෙන් ඉවත් කළ හැකිය.

# ඔබට අවශ්‍ය නම් විශේෂ සහාය ලැබෙනු ඇත

ඔබට කිසියම් විශේෂ සහායක් අවශ්‍ය නම් ඔබ හැකි ඉක්මනින් බලධාරීන්ට දැනුම් දිය යුතුය. මෙම අවශ්‍යතා ගැබ් ගැනීම, අසනීප හෝ මානසික, ශාරීරික හෝ ලිංගික හිංසනයේ අත්දැකීම් වැනි විවිධ තත්වයන් නිසා ඇති විය හැකිය.

බලධාරීන් ඔබේ තත්ත්වය තක්සේරු කරනු ඇති අතර රැකවරණ ක්‍රියාපටිපාටියට ඔබේ සහභාගීත්වය පහසු කිරීම සඳහා අමතර සහාය ලබා දිය හැකිය. උදාහරණයක් ලෙස, ඔවුන් ඔබේ තත්ත්වයට අනුව විශේෂිත කාර්ය මණ්ඩලයක් පත් කළ හැකිය නැතහොත් රැකවරණ ක්‍රියාපටිපාටියේ කාලසීමාව සකස් කළ හැකිය.



# ඔබට ඔබේ රටට ආපසු යාමට අවශ්‍ය නම් කුමක් කළ යුතුද?

රැකවරණ ක්‍රියාවලිය   අතරතුර ඕනෑම අවස්ථාවක, ඔබට ස්වේච්ඡාවෙන් ආපසු යාමට තීරණය කළ හැකිය:

- ඔබේ රට වෙත හෝ
- ඔබට අයිතියක් තිබේ නම්, සංක්‍රමණ රටක් හෝ වෙනත් තුන්වන රටක් වෙත.

ඔබ ස්වේච්ඡාවෙන් ආපසු යාමට තීරණය කළහොත්, ඔබේ සරණාගත ක්‍රියාවලිය   නවත්වනු හෝ ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ජර්මනියේ රැඳී සිටීමට ඔබට තවදුරටත් අයිතියක් නොමැති වේ.

ඔබට ස්වේච්ඡාවෙන් ආපසු යාමට අවශ්‍ය නම්, කරුණාකර පහත බලධාරී අමතන්න:

සංක්‍රමණ හා සරණාගතයන් පිළිබඳ ෆෙඩරල් කාර්යාලය – ආපසු යාම සඳහා දුරකථන උපකාර සේවාව

Frankenstraße 210

90461 Nürnberg

දුරකථන: +49 911 943 – 0

ෆැක්ස්: +49 911 943 - 1000

ආරක්ෂිත සහ නීත්‍යානුකූල ආපසු යාමක් සඳහා ඔබට උපදේශනය සහ සහාය ලබා ගත හැකිය.



## තොරතුරු ලද බව තහවුරු කිරීම

ඔබට මෙම තොරතුරු ලැබුණු බව තහවුරු කරන ලෙස නිලධාරියෙකු ඔබෙන් අසනු ඇත.

ඔබට යමක් වැටහෙන්නේ නැතිනම් හෝ ඔබට අමතර ප්‍රශ්න තිබේ නම්, ඔබට සැමවිටම විමසිය හැකිය.

# මගේ සටහන්

# මගේ සටහන්

euaa
EUROPEAN UNION
AGENCY FOR ASYLUM

සංක්‍රමණ හා
සරණාගතයන්
පිළිබඳ ෆෙඩරල්
කාර්යාලය

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමගින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025

Publications Office
of the European Union

ISBN 000-00-00-00000-0
doi:00.0000/0000000
AA-00-00-000-DE-C